# ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය සඳහා චීන බෞද්ධ සංස්කෘතික බලපෑම

බී. ඒ. එන්. හේමින්ද බස්නායක[1]

## හැඳින්වීම

සංස්කෘතිය වනාහි 'සකස් කොට ගත් දෙය' යනුවෙන් සංක්ෂිප්ත අර්ථකථනයක් කළ හැකි ය. භාෂාව, ඇඳුම පැලඳුම, ගෘහ නිර්මාණ ශිල්පය ඈ සෑම අංශයකට ම මෙන් ම ආගම විෂයෙහි ද සංස්කෘතියක් පවතී. කිසියම් ජන සමූහයක් සම්මත කොට ගත් සංස්කෘතික තත්ත්වයන් විවිධ ජන කොටස් අතර වෙනස් ස්වරූපයකින් ප්‍රචලිත වෙයි. ආගමික සංස්කෘතිය ද රටින් රටට වෙනස් වන බව කිව හැකි ය. දේශාන්තර වශයෙන් පවත්නා සංස්කෘතික සංස්පර්ශය හේතුවෙන් එහි යම්බඳු මිශ්‍රණයක් ද දක්නා ලැබේ. ලාංකේය බෞද්ධාගමික සංස්කෘතිය කෙරෙහි ද වෙනත් රටවල ආභාසය දක්නා ලැබේ. ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතියෙහි ඇතුළත් විදෙස් බෞද්ධ සංස්කෘතික භාවිතයන් මොනවාද? යන්න මෙහි දී ඇති වූ පර්යේෂණ ගැටලුව යි. ලාංකේය බෞද්ධ සංස්කෘතියෙහි විවිධ සංස්කෘතිකමය සම්මිශ්‍රණ විශද වන අතර එහි විදෙස් බෞද්ධ සංස්කෘතික භාවිතයන් තීව්‍ර අන්දමින් ක්‍රියාත්මක වන බව උපන්‍යාසය වශයෙන් ගෙන පර්යේෂණ ක්‍රියාදාමයෙහි නිරත විය. සෛද්ධාන්තික රාමුව ලෙස විදෙස් රටවල් අතුරෙන් චීන රාජ්‍යය කෙරෙහි අවධානය යොමු වූ අතර එහි බෞද්ධ සංස්කෘතික ලක්ෂණ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය කෙරෙහි කොතෙක් බලපා ඇති ද යන්න පිළිබඳ ව මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කැරිණ.

## ක්‍රමවේදය

මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය හා විෂය ක්ෂේත්‍රයෙහි වියත් ප්‍රාමාණිකයන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා යනාදිය උපයෝගී විය. චීන සංස්කෘතික ලක්ෂණ හා ක්‍රමවේද අනුදත් ස්ථාන කිහිපයක් මෙහි ලා විශේෂයෙන් විමර්ශනයට හසු විය. සංස්කෘතිය, බෞද්ධ සංස්කෘතිය හා තදාශ්‍රිත කරුණු අධ්‍යයනය සඳහා ද්විතියික මූලාශ්‍රය ලෙස ග්‍රන්ථ පරිශීලනය ද තෘතියික මූලාශ්‍රය වශයෙන් පුවත්පත්, සඟරා, අන්තර්ජාලය උපයුක්ත වූ බව සඳහන් කළ හැකි ය.

[1] කනිෂ්ඨ අධිශිෂ්‍යත්වලාභී, මානවශාස්ත්‍ර පීඨය, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nipunaheminda90@gmail.com

## ප්‍රතිඵල හා සාකච්ඡාව

නැතක් කාලයක පටන් චීනය හා ශ්‍රී ලංකාව අතර පැවැති අන්තර් සබඳතා හේතුවෙන් දෙරටේ බැඳීම් වර්තමානය වනවිට උත්කෘෂ්ට තලයකට පත් ව තිබේ. දැනට ලංකාව හා චීනය අතර බෞද්ධාගමික වශයෙන් ද පවත්නා බැඳීම අතිශය දෘඪතර වූවකි. චීනයේ අධාර උපකාර යටතේ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය ද නඟා සිටුවීමට කටයුතු සිදුවෙයි. විශේෂයෙන් විහාරාරාම කිහිපයක් ම චීන ආධාර උපකාර හා සම්පත් දායකත්වය මත ලංකාවේ ස්ථාපනය වී තිබේ. ඒවායේ භෞතික හා අභෞතික සංස්කෘතියට අයත් අංගෝපාංග හා ඒ හා සබැඳි කටයුතු කෙරෙහි ශ්‍රී ලාංකිකයෝ ද එක් ව සිටිති. මෙවැනි තත්ත්වයන් හේතුවෙන් ලාංකේය බෞද්ධ සංස්කෘතියට චීන බෞද්ධ සංස්කෘතික සංලක්ෂණ සම්මිශ්‍රණය වීමක් සිදුවේ.

ලාංකේය බෞද්ධ සංස්කෘතියෙහි පවත්නා චීන බෞද්ධ සංස්කෘතික සංකල්ප හා භාවිතයන් රැසක් පර්යේෂණයේ දී අනාවරණය විය. ඒවා භෞතික හා අභෞතික සංස්කෘතික තත්ත්වයන් නියෝජනය කරයි. විශේෂයෙන් ම චීන බෞද්ධ සංස්කෘතික භාවිතයන් අනුගමනය කරන විහාරරාම කිහිපයක් ම හඳුනාගත හැකි විය. එමෙන් ම චීනයේ උපයුක්ත කලාශිල්ප ආදිය තත් විහාරරාමවල දක්නා ලැබේ. කොළඹ හුණුපිටිය ගංගාරාම විහාරයේ ඇති බොහොමයක් කලා ශිල්ප චීන බෞද්ධ සංස්කෘතික තත්ත්වයන් නිරූපණය කරයි. එහි ඇති බුදු පිළිම, ගොඩනැගිලි ආශ්‍රිත ව ඇති ඇත් රූප හා ඒවායේ කුළුණුවල දක්නා ලැබෙන කැටයම් යනාදිය තදීය තත්ත්වයන්ට කදිම නිදර්ශන සපය යි.

එමෙන් ම ලාංකේය බෞද්ධ සංස්කෘතියෙහි චීන බෞද්ධ සංස්කෘතියට අදාළ පූජා වස්තු රැසක් භාවිතයේ පවතින බැව් අනාවරණය විය. සුවඳකූරු, ඉටිපන්දම් යනාදිය මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ හැකි ය. වැඩි වශයෙන් ආමිස පූජා විධිවලට ගිණිය හැකි සැරසිලි හා අලංකරණ උපාංග රැසක් ලාංකේය බෞද්ධ සංස්කෘතියෙහි උපයුක්ත ය. වෙසක් කූඩු වර්ග, කූඩා තොරණ, පහන් හා පින්තූර ආදී කොටගත් සැරසිලි වර්ග යනාදිය හඳුනාගැනීමට හැකි විය.

මීට අමතර ව පර්යේෂණයේ දී චීන බෞද්ධ සංස්කෘතියෙහි අන්තර්ගත වන්දනා ක්‍රම ද ලාංකේය බෞද්ධ විහාරරාමවල දක්නා ලැබෙන බැව් අනාවරණය විය. චීන ජාතිකයන් විසින් සිදු කරනු ලබන මෙම වන්දනා ක්‍රම අනුගමනය කිරීමට ලාංකිකයන් ද බොහෝ පිරිසක් එක් ව ඇති බැව් කිව යුතු ය. ඇතැම් විට චීන සම්පත් දායකත්වය මත සපුරා ම තත් සංස්කෘතික ලක්ෂණ අන්තර්ගත ව විහාරරාම ලංකාවේ ඉදි ව තිබේ. කුරුණෑගල පොතුහැර ප්‍රදේශයේ පිහිටා ඇති

'චීන බොදු හඬ' හෙවත් 'Sri Lanka Pure Land Learning Centre' නමැති ස්ථානය එබන්දකි.

ඇදහිලි හා විශ්වාස ද ලාංකේය බෞද්ධ සංස්කෘතියෙහි ක්‍රියාත්මක වෙයි. එයින් ප්‍රමුඛතම අවස්ථාවක් වෙන් වන්නේ ෆෙංෂුයි කලාව සම්බන්ධව ය. ෆෙංෂුයි කලාව හා සම්බන්ධ බහුවිධ භාවිතයන් ලංකාවේ පවතී. ලුණු භාජනය, සහල් මුට්ටිය, සැන්ඩ්‍රියානා පැළෑටිය, සුබ සම්මත දිශා, සුබ සම්මත සතුන්, කාසි වර්ග සහ සංකේත වන රන් ගෙම්බා (ගෝල්ඩන් ෆොග්), මකර ඉබ්බා සහ ලාෆින් බුද්ධා/ලාෆින් බුදා යනාදිය ඒවා අතුරෙන් තීව්‍ර ලෙස ඉස්මතු ව තිබේ. මෙයින් බෞද්ධ සංස්කෘතියට අදාළ ව ලාෆින් බුද්ධා යන සංකල්පය ක්‍රියාත්මක වෙයි. ලෞකික වශයෙන් දියුණුවක් අත්පත් කර ගැනීම, රෝග නිවාරණය, සංතෘෂ්ටියෙන් යුතු ජීවිතයක් උදා කර ගැනීම යනාදිය ෆෙංෂුයි කලාවෙන් මිනිස්සු අපේක්ෂා කෙරෙති. එහෙත් මෙය බෞද්ධ ධර්මයෙහි ඇති සංකල්ප හා කොතෙක් දුරට සමපාත වන්නේ දැයි සිතිය යුතු ය. බොහෝ විට ෆෙංෂුයි හි සංකල්පය බෞද්ධ දර්ශනයට සාකල්‍යයෙන් ප්‍රතිපක්ෂ බවක් හඟවන බව ඒ පිළිබඳ වැඩිදුර විමර්ශනවල දී තහවුරු වන්නකි. විශේෂයෙන් බෞද්ධ දර්ශනයේ ආර්ථික සමෘද්ධිය ඇති කර ගන්නා අන්දම ද පැහැදිලි ව ම පෙන්වා දී තිබෙන අතර ම මිථ්‍යා විශ්වාස එමගින් ප්‍රත්ක්ෂේප කරනු දැක ගත හැකි ය. තතු එසේ වුව ද ෆෙංෂුයිවල ආරම්භය සේ සැලකෙන චීනයේ ප්‍රචලිත මෙය මේ වනවිට ලංකාවේ ඇතැම් බෞද්ධ සිද්ධස්ථානවල ද දක්නා ලැබේ. මෙම තත්ත්වය හේතුවෙන් එබඳු විශ්වාස කෙරෙහි ලාංකික බෞද්ධ ජනතාවගේ යම්බඳු පෙලඹවීමක් වර්තමානය වන විට වැඩි වශයෙන් සිදු වන බව කිව හැකි ය.

විදෙස් කෞතුකාගාර පිහිටා ඇති බෞද්ධ සිද්ධස්ථාන ද පවතී. මහනුවර දළදා මාලිගාවේ ද එවැනි කෞතුකාගාරයක් පිහිටා තිබේ. මෙහි චීන බෞද්ධ කෞතුකාගාරයක් ද පිහිටා තිබෙන අතර චීනයේ භාවිත බෞද්ධ අංග උපාංග හා සංස්කෘතික උපකරණ ආදියෙහි අනුරූ දක්නට ලැබේ. විවිධ වන්දනා ක්‍රම, පන්සල්වල ආකෘති හා වෙනත් භාවිතයන් දක්නා ලැබේ. මෙවැනි සංස්කෘතික තත්ත්වයන් නැරඹීම සඳහා දෛනික ව මෙම ස්ථානයට විශාල පිරිසක් පැමිණෙති. ඒ අතුරෙන් විදෙස් ප්‍රජාව දැක ගත හැකි වන්නේ මඳ වශයෙනි. වැඩි ප්‍රමාණයක් මෙවැනි ප්‍රදර්ශන කුටි නැරඹීමට පැමිණෙන්නේ දේශීය සංචාරකයන් ය. එහෙයින් චීන සංස්කෘතික ලක්ෂණ කෙරෙහි මෙරට ජනයාගේ අවධානය යොමු වෙමින් පවතී.

සමාලෝචනය

ලංකාවේ භාවිත චීන බෞද්ධ සංස්කෘතික ලක්ෂණ භෞතිකමය නොවන හා භෞතිකමය භාවිතයන් ලෙස වෙන්කොට දැක්විය හැකි අතර ම එබඳු ලක්ෂණ රැසක් ක්‍රියාත්මක බව ඉහත කරුණු අනුව ගම්‍යමාන වෙයි. ඇතැම් අවස්ථාවන්හි මෙරට පැරණි සමාජ ක්‍රමවල පැවැති ආගමානුකූල සංස්කෘතික තත්ත්වයන් වන අභිචාර ක්‍රමවේද ද වර්තමානයේ භාවිත විදෙස් බෞද්ධ සංස්කෘතික භාවිතයන් ඔස්සේ අභියෝගයට ලක් වෙමින් පවතී. ඇතැම් විට මෙරට කලා ශිල්ප හා වෙනත් භෞතිකමය අංග උපාංගවල වලංගුභාවයට තර්ජනයක් ඇති වන බැව් සිතිය හැකි ය. තතු එසේ වුව ද ඉහත අප සිදු කළ අනාවරණයන්ට අනුව චීන බෞද්ධ සංස්කෘතික ලක්ෂණ තවදුරටත් ලාංකේය ජනතාව අතර අභිවර්ධනය වනු ඇති බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද : චීනය, බෞද්ධ, වන්දනා ක්‍රම, ෆෙංෂුයි

ආශ්‍රිත ග්‍රන්ථ

චන්ද්‍රකීර්ති, වරුණ. (2011). *චීන කතාව.* නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

මා වුන් චූන්. (2007). *මකරා සහ චීන සංස්කෘතිය.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විමලවංස හිමි, බද්දේගම. (2000). *අපේ සංස්කෘතිය.*කොළඹ: සමයවර්ධන පොත්හල.

Rongxiang, Jia. *Highlights of Chinese Culture* (Foreign Language Press 2007) http://nadeeshang.blogspot.com/p/blog-page_4826.html